www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නේපාලයේ මාවෝවාදී අගමැති ඉල්ලා අස්වෙයි

## Nepal's Maoist prime minister steps down

ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි

2009 මැයි 08

මාවෝවාදීන් විසින් නායකත්වය දුන් ආන්ඩුව බලයට පත් වී මාස නමයක් ගතවීමටත් පෙර පසුගිය ඉරිදා බිඳ වැටීම මගින් නේපාලය තුල නව දේශපාලන අර්බුදයක් උද්ගත වීය. නේපාලයේ මාවෝවාදී එක්සත් කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඑන්එම්) නායක පුෂ්පා කමල් ඩාල් (ප්‍රචන්ඩ යන අන්වර්ත නාමයෙනුත් හඳුන්වන) සිය අගමැති තනතුරෙන් සඳුදා ඉල්ලා අස්විය.

සිවිල් පාලනයට "අවනත නොවීම" ගැන චෝදනා කරමින් හමුදා ප්‍රධානී ජෙනරාල් රුක්මල් ගුද් කටවාල් තනතුරෙන් නෙරපීමට ඩාල් උත්සාහ කිරීමෙන් පසුව පාලක සභාගය බිඳ වැටුනි. පාර්ලිමේන්තුව තුල එයට තිබුන බහුතරය අහිමි කරමින් එක්සත් මාක්ස් ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය (සීපීඑන්-යූඑම්එල්) ඇතුලු එහි හවුල්කරුවෝ සභාගයෙන් ඉවත් වූහ.

අගමැතිට එවන් බලයක් නැති බව ප්‍රකාශ කරමින් ජෙනරාල් කටවාල් ඔහුව තනතුරෙන් නෙරපීම පිලිගැනීම ප්‍රතික්ෂේප කර ඇත. රටේ අන්තර් කාලීන ව්‍යවස්ථාව යටතේ හමුදාව සම්බන්ධයෙන් නිල වශයෙන් අධිකාරී බලය පැවැරී ඇත්තේ ජනාධිපති රාම් බරාන් යදෙව්ට ය. හෙතෙම තත්වාරක්ෂක නේපාල කොංග්‍රස් පක්ෂයේ (එන්සීපී) නායකයෙකි. අගමැතිගේ නියෝගය නිෂ්ප්‍රභ කල යදෙව් "තනි මතයට" ක්‍රියා කිරීම ගැන මාවෝවාදීන්ට චෝදනා කලේය.

ජනාධිපතිගේ ක්‍රියාව "ව්‍යවස්ථා විරෝධී සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී" යැයි හෙලා දුටු ඩාල් අර්බුදය තවත් ගැඹුරු කිරීම ගැන "විරුද්ධ පක්ෂවලට සහ විදේශ බලයන්ට " දෝෂාරෝපනය කලේ ය. සන්නද්ධ අරගලයට යලි අවතීර්න වීම ගැන ඔහු කිසි දු ඉඟියක් කලේ නැත. නමුත්, ඒ වෙනුවට "හිතකාමී පරිසරයක් නිර්මානය කිරීම ට සහ සාම ක්‍රියාවලිය ආරක්ෂා කිරීම" සඳහා තමන් ඉල්ලා අස්වූ බව ඔහු ප්‍රකාශ කලේ ය. සෙනසුරාදා වන විට නව රජයක් පිහිටුවන ලෙස ජනාධිපති යදෙව් ඉල්ලා සිටි නමුත් 20 අධික විරුද්ධ පක්ෂවලට ස්ථාවර සභාගයක් පිහිටුවීමට හැකිවේ දැයි සැක සහිත ය. ආසන 601 ආසන 238 හිමිකරගෙන සිටිනා මාවෝවාදීහු නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට කැඳවුම් කර ඇති ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය තුල ආධිපත්‍යය දරති. ව්‍යවස්ථාව සම්මත කිරීම සඳහා තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍යය.

ජනාධිපති ඔහුගේ ව්‍යවස්ථා විරෝධී පියවර නිවැරදි කරන්නේ නම් පමනක් නව රජයක් පිහිටුවීමට ඔහුගේ පක්ෂය සහයෝගය දෙන බව ඩාල් ඊයේ ප්‍රකාශ කලේ ය. ඉරිදා සිට කත්මන්ඩු නගරය තුල මාවෝවාදීන්ට පක්ෂ සහ විපක්ෂ විරෝධතා පැන නැගී තිබේ. පොලීසිය සඳුදා අගනුවර ඇතුලත විරෝධතා පෙලපාලි තහනම් කල අතර අඟහරුවාදා සහ බදාදා විරෝධතාකරුවන් විශාල සංඛ්‍යාවක් අත් අඩංගුවට ගත්තේ ය.

මාවෝවාදීන් සහ හමුදා නිලධාරීන් අතර සතුරුකම ආරම්භ වූයේ රට තුල දිග් ගැස්සුන සිවිල් යුද්ධයේ දී ය. ගයනේන්ද්‍ර රජුට එරෙහිව පැන නැගුන මහජන විරෝධතා ව්‍යාපාරයකට පසුව 2006 දී ගිවිසුමකට ඇතුල් වූ මවෝවාදීන් ආයුධ බිම තබා, අන්තර් කාලීන ආන්ඩුවකට සම්බන්ධ වූහ. 2008 අප්‍රේල් මාසයේ දී ඔවුහු මැතිවරනයකට සහභාගි වූහ. නව ජාතික සභාව මගින් රාජාංඩුව අහෝසි කල අතර අගෝස්තු මාසයේ දී මාවෝවාදීහු ආන්ඩුවක් පිහිටුවූහ.

එහෙත් අධස්ථයෙහි පැවති ආතතිය එලෙස ම පැවැතුනි. රාජාන්ඩුවේ ප්‍රධාන මුක්කුවක් වූ හමුදාව විවෘතව ම ආන්ඩුව කෙරෙහි ප්‍රකෝපකාරී විය. 2006 සාම ගිවිසුම යටතේ, දහස් ගනනක් හිටපු මාවෝවාදී සටන්කරුවන් හමුදාවට අනුයුක්ත කිරීම ජෙනරාල් කටවාල් විසින් දිගටම ප්‍රතික්ෂේප කලේ ය. හිටපු ගරිල්ලන් නොසලකා හරිමින් හමුදාවට අලුතෙන් බඳවාගැනීමට තීන්දු කිරීමෙන් පසුව ආන්ඩුව ජෙනරාල් නෙරපීමට තීන්දු කලේ ය. මාවෝවාදීන්ගේ නිදහස් වෙලඳපොල න්‍යාය පත්‍රය සහ විදේශ ආයෝජන ආකර්ෂනය කර ගැනීමේ උත්සාහය තිබියදී ම, නේපාල සංස්ථාපිතයේ තත්වාරක්ෂක ස්ථර ඔවුන් කෙරෙහි තදබල ලෙස සතුරුතාවය පෙන්නුම් කලහ. වර්ජන තහනම් කල ආන්ඩුව එහි ආර්ථික වගකීම් සම්බන්ධව ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රශංසා කල අයවැයක් ක්‍රියාවට දැමීය.

ඉඩම් ප්‍රතිසංස්කරන, තරුන ජනයා සඳහා රැකියා සහ දුප්පතුන් සඳහා සහනාධාර දීම මගින් දරිද්‍රතාවයෙන් පෙලෙන රටේ බහුතර ග්‍රාමීය ජනයාගේ ජීවන තත්වයන් වැඩි දියුනු කිරීමේ සියලුම මැතිවරන පොරොන්දු සීඑන්-එම් විසින් මුලුමනින්ම ඉවත දැමීය. රටේ ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 250 පමන විය. එය ලෝකයේ පහල ම මට්ටම්වලින් එකකි. තක්සේරුගත සියයට 55 දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත් වෙති.

පසුගිය වසර පුරා ම සිදු වුයේ රටේ ආර්ථික සහ සමාජ අර්බුදය වඩාත් නරක අතට හැරීම පමනි. ආහාර සහ තෙල් සැපයුම අඩාල වී ඇත. දවසේ වැඩි කාලයක් තුල අගනුවරට විදුලි බලය නැත. උද්ධමන රේට්ටුව මාර්තු මාසයේ දී සියයට 13.7කි. ගෝලීය ආර්ථික පසුබැස්ම හේතු කොට ගෙන ඇඟලුම් අපනයනය, සංචාරක කර්මාන්තය සහ විදේශ රටවල සිටින නේපාල සංක්‍රමනික කම්කරුවන්ගෙන් ලැබෙන ආදායම පහත වැටී තිබේ.

නේපාල ජනාධිපතිගේ සහ හමුදා ප්‍රධානියාගේ ස්ථාවරයට ඉන්දියාවේ සහයෝගය ලැබී අත. ඩාල් හමුවූ නේපාලයේ ඉන්දියානු තානාපති රකේස් සූද් ජෙනරාල් කටවාල් තනතුරෙන් නෙරපීම නොකරන ලෙස බලපෑම් යෙදුවේ ය. මාවෝවාදී බලපෑම පාලනය කිරීමේ මාධ්‍යයක් ලෙස ඉන්දියාව හමුදාවට සහ නේපාල සංස්ථාපිතයට  සහයෝගය දෙයි.

තම රට තුල මාවෝවාදී කැරලි පාලනය කිරීමේ කොටසක් ලෙස 2006 සාම ගිවිසුමට බ්‍රෝකර්කම කරමින් ඉන්දියාව ප්‍රධාන භූමිකාවක් ඉටු කලේ ය. නේපාල මාවෝවාදීන්ට විරුද්ධ වූ බීජිනය කත්මන්ඩුවල පදනමක් හදා ගැනීම වැලැක්වීම කෙරෙහි ද ඉන්දියාව සැලකිලිමත් වෙයි. ජීවිතය සමග සමීප සම්බන්ධකම් නැති නමුදු නේපාල කටයුතු කෙරෙහි ඉනදියාවේ අධිපති භූමිකාව සම්බන්ධයෙන් සීපීඑන්-එම් නිතරම විරුද්ධ වී ඇත.

ඉන්දියානු විදේශ කටයුතු අමාත්‍යංශයේ නිලධාරියෙක් මෙම සතියේ දී ටයිම්ස් ඔෆ් ඉන්දියා පත්‍රයට මෙසේ පැවසී යː "අතීතයේ දී ඉන්දියාවේ දෙගිඩියාව විසින් මියැන්මාරයේ, ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල නිර්මානය වූ හිස්තැන පිරවීම සඳහා චීනය ක්ෂනික පියවර ගත්තේ ය. ප්‍රචන්ඩ (ඩාල්) බලයේ සිටිනා තතු තුල නේපාලයේ ද එම මාවතේ ම ගමන කරමින් සිටී."

වර්තමාන අර්බුදය පිලිබඳ එක්සත් ජනපදය ප්‍රකාශයක් නිකුත් කර නැත. එහෙත්, ඔබාමා පරිපාලනය, පසුගිය මාසයේ නේපාලය සම්බන්ධ එහි වාර්තාවේ දී සීපීඑන්-එම් එක්සත් ජනපදය විසින් " නම් කල ත්‍රස්තවාදී සංවිධනයක්" ලෙස නමවත් පවත්නා බව සඳහන් කලේ ය.

බුෂ් පරිපාලනය යටතේ මාවෝවාදීන්ට බරපතල ලෙස විරුද්ධ වූ එක්සත් ජනපදය, ඉන්දියාව විසින් බ්‍රෝකර්කම් කල 2006 සාම ගිවිසුම පිලිගත්තේ අකමැත්තෙනි. නේපාල මාවෝවාදීන් විසින් වොෂින්ටනය සැනසීම සඳහා කල විවිධ උත්සාහයන් පැවතිය ද ඔබාමා, පරිපාලනය විසින් එම ප්‍රතිපත්තිය දිගටම පවත්වා ගෙනයනු ලබයි.

අවධි දෙකේ ස්ටැලින්වාදී ප්‍රතිගාමී න්‍යාය මගින් මෙහෙයවනු ලබන මාවෝවාදීහු වැඩවසම්වාදී පාලනය පලවා හරිමින්, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර, ධනවාදී වර්ධනයට ඉඩ සැලසීම මගින් ජාතික ආර්ථික සංවර්ධනයන්ට මග පාදන "ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක්" කරන බව ප්‍රකාශ කරති.

එහෙත්, සාමයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සමෘද්ධියේ නව කාල පරිච්ඡේදයක් සඳහා වේදිකාව සැකසීමක්  නොව ඒ වෙනුවට මාවෝවාදී ආන්ඩුව කලේ 2006 පැන නැගුන මහජන ව්‍යාපාරය පාලනය කර හමුදාව මත කේන්ද්‍රීය වූ නේපාල සංස්ථාපිතයේ වඩාත් දක්ෂිනාංශික කොටස්වලට ප්‍රතිප්‍රහාරය සඳහා යලි කාන්ඩ ගැසීමට ඉඩ සලසා තිබේ.

ජෙනරාල් කටවාල් විසින් ආන්ඩුවේ නියෝග ප්‍රතික්ෂේප කිරීම, හමුදාව කුමන්ත්‍රනයකට සූදානම් වෙමින් සිටින බවට සමපේක්ෂන අවුලුවා ලීය. කුමන්ත්‍රනයක් සහ ඇඳිරිනීතිය සම්බන්ධ කටකථාවලට පදනමක් නැත. නේපාල හමුදාව කිසි දිනක කුමන්ත්‍රනයක් කරන්නේ නැත. නේපාල හමුදාව නිතරම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට කැප වී සිටි අතර මතුවටත් කරනු ඇතයි" ප්‍රකාශයක් නිකුත් කිරීමට මෙම සමපේක්ෂනයන් මගින් හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් රවින්ද්‍ර චෙට්ට්ට බලකැරුනේය.

එහෙත්, රාජාන්ඩුවේ ආඥාදායක පාලනයට සැම විට ම සහයෝගය දීමේ සහ කවර හෝ විරුද්ධත්වයක් රුදුරු ලෙස මැඩීමේ දිගු ඉතිහාසයක් හමුදාවට තිබේ. තත්වාරක්ෂක පක්ෂ, ව්‍යාපාරික ප්‍රභූව, රාජ්‍ය උපකරන සහ මාධ්‍යවල සහයෝගය ඇතිව. මාවෝවාදීන්ගේ ආර්ථික පිලිවෙත් කෙරෙහි මහජන අතෘප්තිය ගසා කෑමේ උත්සාහයක හමුදා ජෙනරාල්වරු නිශ්චිතව ම යෙදී සිටිති.

වර්තමාන දේශපාලන අර්බුදය තුලින් කවර ආන්ඩුවක් බලයට ආවත් කවර මාධ්‍යයකින් හෝ නේපාලයේ ධනේශ්වර පාලනය ආරක්ෂා කිරීමට හමුදාව හොඳින්ම සූදානම්ව සිටී. එහි වැඩ කටයුතු එල්ල කෙරෙනු ඇත්තේ හුදෙක් මාවෝවාදීන්ට එරෙහිව පමනක් නොව, කවර හෝ විරුද්ධත්වයක්, විශේෂයෙන් ම කම්කරු පන්තියේ සහ පීඩිත ජනයාගෙන් මතුවන විරුද්ධත්වයන් මැඩීමට යොමු වනු ඇත.

© www.wsws.org